# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කාසිම් පදනම
## (සංස්ථාගත කිරීමේ)

**කාසිම් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අලි සාහිර් මවුලානා සෙය්යිඩ් මහතා
විසින් 2015 දෙසැම්බර් මස 11 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[47 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009563—225 (2015/12)

# කාසිම් පදනම
# (සංස්ථාගත කිරීමේ)

## කාසිම් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

“කාසිම් පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, එකී පදනම සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2015 අංක දරන කාසිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කාසිම් පදනම සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) කාසිම් පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” වශයෙන් හඳුන්වනු ලබන), “කාසිම් පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මත්ද්‍රව්‍ය, ස්වාභාවික විපත්, තොරතුරු තාක්ෂණය හා සෞඛ්‍යය සම්බන්ධයෙන් අධ්‍යාපනය සැලසීම ;

2—PL 009381 -300 (2015/11)

(ආ) අ.පො.ස. (සා.පෙ.), අ.පො.ස. (උ.පෙ.) විභාගවල ශිෂ්‍යයන් හා 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යයන් සඳහා විශේෂ පෙරහුරු වැඩසටහන් පිළියෙල කිරීම ;

(ඇ) දහම් පාසල් හා පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වැඩමුළු හා සාකච්ඡා පැවැත්වීම ;

(ඈ) ධීවර කර්මාන්තය හා කෘෂිකර්මාන්තය සඳහා උපකරණ, මෙවලම් ආදිය සැපයීම ;

(ඉ) පාරම්පරික ක්‍රීඩා සඳහා තරුණයන් උනන්දු කරවීම හා ඔවුන්ට වෘත්තීය සංවර්ධන සොයා දීම ;

(ඊ) කාන්තා ජන සමාජයේ සෑම අංශයක් සඳහා ම අවස්ථා හා ප්‍රමුඛතාව ලබා දීම ;

(උ) කාන්තාවන් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති පුහුණු ඇති කිරීම, ඒ සඳහා පහසුකම් සැපයීම හා ක්‍රියාත්මක කිරීම;

(ඌ) සම අයිතිවාසිකම් ලබා ගැනීමේ දී කාන්තාවන්ට සිදු කෙරෙන වෙනස්කම්වලට එරෙහිව නීතිමය ආධාර හා උපකාර සලසා දීම;

(එ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට හා රණවිරුවන්ට ගරු කිරීම හා ඔවුන්ට ප්‍රමුඛ සේවා සැපයීම ;

(ඒ) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඒවා පිළිබඳව දැනුවත් කිරීම ; සහ

(ඔ) සංස්ථාවේ පරමාර්ථ සියල්ල ම හෝ ඉන් යමක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

දේපළ අත්කරගැනීම, අරමුදල් ආයෝජනය කිරීම සහ ණය ගැනීම යනාදිය පිළිබඳව සංස්ථාවේ බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට ;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා රජයේ අනුමත බැංකු හා ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට හෝ ආධාර සහ පරිත්‍යාග (දේශීය හෝ විදේශීය වශයෙන්) පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි ලබා ගැනීමට ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලයට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා වැසීමට ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන යම් අරමුදලක් පාලක මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඊ) යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමඟ ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(උ) යම් ස්ථාවර දේපලකට හෝ පෞද්ගලික දේපලකට බලපාන නීත්‍යානුකූල භාර සහ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට ;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා සේවක පිරිස්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පුහුණු කිරීමට ; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**5.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) පාලක මණ්ඩලය තෝරා පත් කර ගැනීම, නිලධරයන් ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ පාලක මණ්ඩලයේ බලතල, කාර්ය සහ චර්යාව ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ හැසිරීම ;

(ඈ) පාලක මණ්ඩලයේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම්වල දී පුරප්පාඩු පිරවීම, දැන්වීම් සහ න්‍යායපත්‍ර, රැස්වීම පිළිබඳ ගණපූරණය සහ ඒවායේ දී කටයුතු කරගෙන යාම ;

(ඉ) පාලක මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ; සහ

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ රීති මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාවේ අරමුදල.**

**6.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, එහි මුදල් වර්ෂය සෑම වර්ෂයක ම ජනවාරි මස 1 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා විය යුතු ය.

(2) සංස්ථාව වෙනුවෙන් භාර ගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන බැංකුවක සංස්ථාවේ නමින් තැන්පත් කළ යුතු ය.

**පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.**

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලු ණය සහ බැරකම්, සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය හා පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**විගණනය හා ගිණුම්.**

**8.** (1) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් පාලක මණ්ඩලය තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

**9.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**10.** සංස්ථාවේ ලේකම්, සභාපති සහ භාණ්ඩාගාරික ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම තම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.